**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල- නව ආකෘතිය - 2016**

---

ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් නව ආකෘතිය යටතේ 2016 දෙසැම්බර් 31 දිනට පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (ජීඑෆ්ඒටීඑම්)අතර 2016 පෙබරවාරි 29 දින එළඹි අංක 857-එල්කේජ්-ටී-එම්ඕඑච් දරන ප්‍රදාන ගිවිසුමේ සී(I) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මූල්‍යයනය හා ව්‍යාපෘති කාලපරිච්ඡේදය

---

ප්‍රදාන ගිවිසුමට අනුව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සහ ස්ථාපනය කිරීමේ වගකීම දරයි. සේවා සපයන ප්‍රදේශවල ක්‍රියාකාරකම් ළඟා කර ගැනීම වැඩි දියුණු කිරීම හා රාජ්‍ය නොවන සංවිධාන හා පුද්ගලික අංශය ප්‍රවර්ධනය මගින් කෙටිකාලීන සෘජු අධීක්ෂණය යටතේ ප්‍රතිකාර වැඩසටහනේ (DOTS) කාර්යක්ෂමතාවය පුළුල් කිරීමෙන් ශ්‍රී ලංකාවේ ක්ෂය රෝගය මර්ධන වැඩසටහන සවිබල ගැන්වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ක්ෂය රෝගය මර්ධන සවිබල ගැන්වීම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,033.99 කට සමාන එජඩො මිලියන 7.91 ක් වන අතර, සම්පූර්ණ මුදලම මූල්‍යයනය කිරීමට ජීඑෆ්ඒටීඑම් (GFATM) එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර, 2018 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(ඌ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**-----------------------------------------------------------**

තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම් වූ කරුණු වාර්තාවේ 4 ඡේදයේ විග්‍රහ කර ඇත.

**2. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**2.1 මතය**

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 4 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද අනෙකුත් වාර්තාවල ඇතුළත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති තොරතුරු සමඟ එකඟ වන බවත්ය.

## 3. මූල්‍ය ප්‍රතිඵල

### 3.1 මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශනවලට අනුව හා ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති වියදම රු.මිලියන 116.40 කට සමාන එජඩො 798,805 ක් විය. විස්තර පහත දැක්වේ.

| අයිතමය | 2016 දෙසැම්බර් 31 දිනට වියදම | |
|---|---|---|
| | එජඩො | රු. |
| පිරියත, යන්ත්‍ර හා උපකරණ | 16,325 | 2,475,850 |
| ක්ෂයරෝග පාලන කටයුතු | 782,480 | 113,929,047 |
| | 798,805 | 116,404,897 |

### 3.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පහත පරිදිය.

| | 2016 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | එජඩො | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල්** | | |
| මුදල් ලැබීම් - විදේශ ආධාර - ප්‍රදාන | 720,805 | 104,822,167 |
| දේශීය අරමුදල් මගින් ලැබීම් | 13,587 | 1,602,826 |
| ටෙන්ඩර් ආදායම | 234 | 34,000 |
| විදේශ විනිමය අලාභ සඳහා ගැලපීම් | (1,399) | - |
| වැඩසටහන් වියදම් සඳහා අරමුදලින් ගෙවීම් | (782,480) | (113,929,047) |
| වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාවය) | (49,253) | (7,470,054) |
| විදේශ විනිමය ලාභය /පාඩුව | - | - |
| ගෙවීම් වැඩිවීම / (අඩුවීම) | (35,690) | (5,412,688) |
| ලැබිය යුතු දෑ වැඩිවීම් / (අඩුවීම) | (1,281) | (194,254) |
| ක්ෂය | 63,628 | 9,649,938 |
| පාරිතෝෂික | 38,921 | 5,902,908 |
| මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් | 16,325 | 2,475,850 |

**ආයෝජන කාර්යයන් සඳහා ගෙවූ මුදල් ප්‍රවාහය**

| | | |
|---|---|---|
| ස්ථාවර වත්කම් | (16,325) | 2,475,850 |
| ආයෝජන කටයුතු සඳහා යොදාගත් ශුද්ධ මුදල් | (16,325) | 2,475,850 |
| ශුද්ධ මුදල් වැඩිවීම/ අඩුවීම | නැත | නැත |
| 2016 ජනවාරි 01 දිනට ශේෂය | - | - |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | නැත | නැත |

## 4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 4.1 ගණකාධිකරණ අඩුපාඩු

ගෝලීය අරමුදලින් සෘජුව ලැබී තිබූ රු.මිලියන 61.35 ක් වටිනා උපකරණ හා රු.මිලියන 65.40 ක් වටිනා ඖෂධ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5 මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 5.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යායනය, වර්ෂය තුළදී අරමුදල් ලැබීම් සහ 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමට අනුව මූල්‍යායනය කිරීමට එකඟවූ මුදල | | වර්ෂය තුළ ලද අරමුදල් | | 2016 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජීඑෆ්ඒටීඑම් | 7.91 | 1,033.99 | 1.61 | 234.75 | 1.59 | 231.62 |
| ශ්‍රී ලංකා රජය | - | - | 0.07 | 11.00 | 0.07 | 11.00 |
| එකතුව | 7.91 | 1,033.99 | 1.68 | 245.75 | 1.66 | 242.62 |

**5.2 භෞතික ප්‍රගතිය**

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙන් රු.මිලියන 18.85 ක් පුහුණු වැඩසටහන් 201 ක් පැවැත්වීම සඳහා වෙන්කරදී තිබූ අතර සෞඛ්‍ය පරීක්ෂකවරුන්, හෙදියන්, වෛද්‍යවරුන් සහ වෙනත් අදාල පාර්ශවයන් පුහුණු කිරීමට එම මුදල් ලබා දී තිබූ අතර එමගින් ලියාපදිංචි වී නොමැති රෝගීන් හඳුනාගැනීම, ඔවුන් ප්‍රතිකාර කිරීම සඳහා යොමුකිරීමට, සායන පැවැත්වීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා විය. කෙසේ වුවත් පුහුණු වැඩසටහන් 64 පමණක් පවත්වා තිබූ අතර රු.මිලියන 6.57 ක් පමණක් ඒ වෙනුවෙන් වියදම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දැනුවත් කිරීමේ වැඩසටහන් 17 ක් ප්‍රාදේශීය සෞඛ්‍ය පරීක්ෂකවරුන් 510 ක් සඳහා පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර වැඩසටහන් 07 ක් පවත්වා නොතිබුණි. සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් 300 ක් සඳහා දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සඳහා සහභාගීවීමට අවස්ථාව සලසා දී නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) විගණනයට සපයන ලද තොරතුරුවලට අනුව, පසුගිය අවුරුදු 03 තුල ක්ෂය රෝගීන් 27,934 ක් ලියාපදිංචි වී තිබූ අතර, එයින් රෝගීන් 935 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට මරණයට පත්වී තිබූ බව වාර්තා විය. කෙසේ වෙතත්, ක්ෂය රෝගීන් හා මරණ පිළිබඳ තොරතුරු ලබා ගැනීමට නොහැකි වීමට රේඛීය අමාත්‍යාංශයට රෝගීන් පිළිබඳ තොරතුරු වාර්තා කිරීමේ ක්‍රමවේදයක් නොමැතිකම හා රෝගීන් තමාගේ රෝගය පිළිබඳ තොරතුරු හෙළි කිරීමට ඇති අකමැත්ත බව විගණනයට අනාවරණය විය.

(ඇ) ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලැබී තිබූ තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාව තුල වර්ෂයකට ක්ෂය රෝගීන් 4000 කට අඩුවෙන් වාර්තා වී ඇති බවත්, කාර්ය මණ්ඩලයට වැඩි පුහුණුවක් සලසා දීම මගින් ක්ෂය රෝග සිද්ධීන් අනාවරණය කර ගැනීමට හා රෝහල්වල පවතින ප්‍රතිකාර කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම යෝජනා ලෙස ඉදිරිපත් වී තිබුණි. කෙසේ වෙතත් අදාල යෝජනා ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**5.3 මූල්‍ය පාලනය පිළිබඳ කරුණු**

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ නිලධාරීන්ට අතුරු අග්‍රිම ලබාදීමේදී ක්‍රියාත්මක වූ අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවයන් පිළිබඳව විගණනයේදී නිරීක්ෂණය වූ අවස්ථා පහත විස්තර කෙරේ.

(i) තත්කාර්ය අතුරු අග්‍රිම මගින් පිරිනැමූ අවස්ථා 175 කදී වියදම් නොකරන ලද ශේෂයන්හි එකතුව රු.මිලියන 5.10 ක් නිරවුල් කර තිබුණේ දින 04 සිට දින 120 දක්වා ප්‍රමාදයන් සහිතවයි. එසේ වුවත් එය නිරවුල් කල යුත්තේ මුදල් ලබාගත් කාර්යය නිම වූ විගසමය.

(ii) තත්කාර්ය අතුරු අග්‍රිම අවස්ථා 35 කදී එකතුව රු.මිලියන 2.09 ක් නිකුත් කර තිබූ අතර අදාල කාර්යය සඳහා භාවිතයට නොගෙන නිරවුල් කර තිබුණේ දින 04 සිට දින 210 දක්වා ප්‍රමාදයන් සහිතවයි. තවද, අවස්ථා 33 කදී අතුරු අග්‍රිම එකතුව රු.966,758 ක් ප්‍රදානය කර තිබුණේ තත්‍ය ඇස්තමේන්තු පිළියෙල කිරීමෙන් තොරව විය.

(ආ) වටිනාකම රු.මිලියන 6.82 කට සමාන එජඩො 44,967 ක්වූ ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම්වල භෞතික සත්‍යාපනය 2016 දෙසැම්බර් 31 දිනට සිදුකර නොතිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙනුවෙන් ගෙවිය යුතු දායකත්ව මුදල් ගෙවීම් ප්‍රමාදවීම නිසා අධිභාර ලෙස රු.මිලියන 2.02 ක් සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

### 5.4 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

ව්‍යාපෘතිය සඳහා අනුමත කාර්ය මණ්ඩලය TB සහයකයන් 80 දෙනෙකුගෙන් සමන්විත වුවද, සමාලෝචිත වර්ෂය තුල රැඳී සිටි නිලධාරීන් සංඛ්‍යාව 60 ක් පමණක් විය. දිස්ත්‍රික් සංස්කෘතික මධ්‍යස්ථානවල විද්‍යාගාර හා ඉතා සියුම් මධ්‍යස්ථානවල ක්‍රියාත්මක කිරීමට නියමිත කාර්යයන් TB සහයකයන් 20 දෙනෙකුගේ පුරප්පාඩුව නිසා සතුටුදායක ලෙස ක්‍රියාත්මකවී නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට වතු සම්බන්ධීකාරකයින් 10 දෙනෙකු හා දත්ත සැකසුම්කරුවන් 09 දෙනෙකුගේ පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබූ බව හා ව්‍යාපෘතියේ මෙහෙයුම් සුමට ලෙස පවත්වාගෙන යාමට එය බොහෝ සේ බලපා තිබූ බව නිරීක්ෂණය විය.